# රණවිරුවා

2020 මාර්තු • 215 කලාපය



ඔබ ඔබේ කොටස
ඉටුකරන තාක්
අපි අපේ සටන
අත් නොහරින්නෙමු...



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.



# කොරෝනා මඩින මෙහෙයුම ඇරඹේ...





මාරාන්තික කොවිඩ් - 19 වෛරසය රට තුළ පැතිරීයාම පාලනය කිරීමේ ජාතික වගකීම ත්‍රිවිධ හමුදාව යළිත් වරක් භාරගෙන තිබේ. ඒ අනුව විදේශීය රටවල සිට මෙරටට පැමිණෙන ශ්‍රී ලාංකිකයන් සහ විදේශිකයින් නිරෝධායනය කිරීම සඳහා මඩකලපුව පූනානි සහ කන්දකාඩු හි වැඩිදියුණු කරන ලද තාවකාලික නිරෝධායන මධ්‍යස්ථාන දෙකක් මේ වනවිටත් ස්ථාපිත කොට ඇත. එමගින් අවම වශයෙන් සති දෙකක කාලයක් පුරා 2000 - 2500 අතර පිරිසකට නේවාසිකව ප්‍රතිකාර කිරීමට අවශ්‍ය සියලු පහසුකම් සූදානම් කොට ඇති අතර ඒ සඳහා දියතලාවේ නිරෝධායන මධ්‍යස්ථානද වෙන් කර ඇත.

වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී පසුගියදා එම මධ්‍යස්ථානවල සංචාරයක නිරතව එහි කටයුතු සොයාබැලූ අතර, ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී, කොළඹ යුද්ධ හමුදා රෝහලේ නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍ය) කර්නල් සවීන් ගමගේ, පොළොන්නරුව සහ මඩකලපුව දිස්ත්‍රික්කවල සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන්, ඇතුලු පිරිසක්ද ඊට එක්වූහ.











# ගජබා රෙජිමේන්තුවේ දෙවන ආරක්ෂක ලේකම් රතු පලස් මතින් පිළිගැනේ...







සාලියපුර ගජබා රෙජිමේන්තු මූලස්ථානයේ පසුගිය මාර්තු 13 දින පැවති ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගජබා රෙජිමේන්තු පවුලේ ප්‍රවීණයෙකු වූ මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා එක්විය. මෙම උත්සවයට ආරක්ෂක අමාත්‍යාංශ සේවා වනිතා ඒකකයේ සභාපතිණිය චිත්‍රාණි ගුණරත්න මහත්මිය, වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන, යුද්ධ හමුදාධිපති මෙන්ම ගජබා රෙජිමේන්තුවේ අධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මෙන්ම ගජබා රෙජිමේන්තු සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මිය ඇතුලු ගජබා රෙජිමේන්තුවේ ප්‍රවීණයන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා ඔවුන්ගේ භාර්යාවන්ද එක්විය.

ගජබා රෙජිමේන්තු මූලස්ථානයේ පැවති මෙම පිළිගැනීමේ උත්සවය ඓතිහාසික වැදගත්කමක් උසුලනුයේ රටේ පළමු පුරවැසි තනතුර වන ජනාධිපති ධූරයද, රටේ ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රබල තනතුරු අතරින් එකක් වන ආරක්ෂක ලේකම් ධූරයද, යුද්ධ හමුදාධිපති ධූරයද දරණුයේ ගජබා රෙජිමේන්තුවේ ප්‍රවීණ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වීමය. මෙය ශ්‍රී ලංකා ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් වනු ඇත.

# "තුරු මිතුරු නව රටක්" අදියර 111

"තුරු මිතුරු නව රටක්" ප්‍රජා ව්‍යාපෘතියේ තුන්වන අදියර පසුගිය මාර්තු 03 දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයට පිවිසෙන ප්‍රධාන මාර්ගය දෙපස දී වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. නව යුද්ධ හමුදා මූලස්ථානය අවට පරිසරය අලංකාරවත්ව, මහජනයාට හිතකර ලෙස සකස් කිරීම සඳහා වූ යුද්ධ හමුදාධිපතිතුමාගේ සංකල්පය ක්‍රියාවට නංවමින් සිදුකෙරුණු රුක් රෝපණය, ශරීර සුවතා මංතීරුව විවෘත කිරීම මෙන්ම යුද්ධ හමුදා මූලස්ථානය වෙත පිවිසෙන මාර්ගය දෙපස ස්ථානගත කළ කාලතුවක්කු අවි ආදියෙන් අලංකාරවත් වූ පරිසරය මහජනතාවගේ පරිහරණය සඳහා වෙන්කිරීම සිදුවිය. තවද "තුරු මිතුරු නව රටක්" ප්‍රධාන ව්‍යාපෘතියේ පුවරුව විවෘත කිරීම, එහි ප්‍රතිසංස්කරණය කරන ලද වැවට මත්ස්‍යයින් 10000 ක් මුදාහැරීම හා මාර්ගය අසල ඉදිකළ කොන්ක්‍රීට් බංකු 24 ක් ජනසතු කිරීම ද ප්‍රධාන අමුත්තාගේ අතින් සිදුවිය.









# බුත්තල නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ ශිෂ්‍ය නිලධාරීන් යුද්ධ හමුදාධිපති හමුවී...

බුත්තල නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන ඒකක අණදෙන නිලධාරී පාඨමාලාව හදාරන නිලධාරීන් පිරිස 2020 මාර්තු 06 දින යුද හමුදා මූලස්ථානයේදී වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ. යුද්ධ හමුදාවේ නව ගමන් මග පිළිබඳව අවබෝධයක් ලබාගැනීමේ අරමුණින් වූ මෙම හමුවට යුද්ධ හමුදා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ද නිලධාරී ප්‍රවර්ධන ප්‍රගමන මධ්‍යස්ථානයේ සේනාවිධායක ද සහභාගී වූහ.



# අන්තර් රෙජිමේන්තු නෙට්බෝල් ශූරතාවලිය...

අන්තර් රෙජිමේන්තු නෙට්බෝල් ශූරතාවලියේ අවසන් මහා තරගය ඉකුත් මාර්තු 06 දින සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. මෙම ශූරතාවලියේ සම්මාන ප්‍රදානෝත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.

තරගාවලිය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා රෙජිමේන්තුව නියෝජනය කරමින් කණ්ඩායම් 03 ක්ද ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බලකාය, ශ්‍රී ලංකා පොලිස් සේවා බලකාය සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් නවක කණ්ඩායමක්ද සමගින් කණ්ඩායම් 06 ක් තරග වැදුණි.





අවසන් තරගයට යුද්ධ හමුදා කාන්තා බලකා **A** කණ්ඩායම සහ යුද්ධ හමුදා කාන්තා බලකා **B** කණ්ඩායම තරග වැදුණු අතර, එහිදී ඉහළ ප්‍රේක්ෂක ප්‍රතිචාර මධ්‍යයේ තියුණු තරගයකින් පසු යුද්ධ හමුදා කාන්තා බලකා **A** කණ්ඩායම ශූරතාවය හිමිකර ගැනීමට සමත්වූහ.



# යුද්ධ හමුදාධිපති සහ ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් අතර හමුවක්...



ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් ඩේවිඩ් හොලි මහතා ඉකුත් මාර්තු 20 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් සහ යුද්ධ හමුදාධිපතිතුමන් අතර පැවති මෙම සාකච්ඡාවේදී රට තුළ මෙන්ම ලෝකය පුරා පැතිර යන මාරාන්තික කොවිඩ් - 19 වෛරසය පිළිබඳ වැඩිදුරටත් කරුණු සාකච්ඡා වූ අතර, එම උවදුර වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානියා වන යුද්ධ හමුදාධිපතිතුමන් විසින් දිවයින පුරා ඇති නිරෝධායන මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය ඇතුළු නිරෝධායන පියවර පිළිබඳවද මහකොමසාරිස්වරයා දැනුවත් කරනු ලැබීය.

# ශ්‍රී ලංකා හමුදා වෛද්‍ය විද්‍යායතනයේ වාර්ෂික සැසිය ඇරඹේ...



ශ්‍රී ලංකා හමුදා විද්‍යායතනයේ වාර්ෂික අධ්‍යයන සැසියේ සමාරම්භක උත්සවය ඉකුත් මාර්තු 13 දින දේශීය හා විදේශීය වෛද්‍ය උපදේශකයින්, වෘත්තීයවේදීන් සහ යුද්ධ හමුදා වෛද්‍ය විශේෂඥයින් රැසකගේ සහභාගීත්වයෙන් දෙහිවල, අත්තිඩිය ලේක්සයිඩ් හෝටලයේදී පැවැත්විණි. මෙහිදී සමාරම්භක සැසියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක ලේකම් (විශ්‍රාමික) මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා සහභාගි වූ අතර, මෙම අවස්ථාවට වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු නාවික, ගුවන් හමුදාධිපතිවරු මෙන්ම සම්භාවනීය අමුත්තන් රැසක්ද සහභාගි වූහ.



# සුහද හමුවක මතක සටහන්...

ශ්‍රී ලංකාවේ පාකිස්ථානු මහකොමසාරිස් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) මුහම්මද් සාද් කාතාක් මහතා ඉකුත් මාර්තු 11 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

මෙම සුහද හමුව අතරතුර ඔවුන් දෙරට අතර පවතින සුහද සබඳතා පිළිබඳ සිහිපත් කරමින් ජාතීන් අතර ද්විපාර්ශවික සහයෝගීතාව තවත් පුළුල් කරමින් ත්‍රිවිධ හමුදාවන් අතර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳවද අදහස් හුවමාරු කර ගත්තේය.



# සෞදි තානාපති ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවේ...



නවදිල්ලියේ පිහිටි සෞදි තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක මාණ්ඩලික බ්‍රිගේඩියර් ජෙනරාල් නවාෆ් ටී ඇලෝටයිබ් 2020 මාර්තු 04 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

එහිදී දෙරටටම අදාළවන වැදගත් කරුණු කිහිපයක් සම්බන්ධව ඉතා දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි.

# පොලිස් විශේෂ කාර්ය බළකායේ නව සේනාවිධායක යුද්ධ හමුදාධිපති හමුවේ...

පොලිස් විශේෂ කාර්ය බළකායේ නව සේනාවිධායක නියෝජ්‍ය පොලිස්පති ලයනල් ගුණතිලක ඉකුත් මාර්තු 11 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

එහිදී එතුමන්ගේ පත්වීමට සිය සුබ පැතුම් එක්කළ යුද්ධ හමුදාධිපතිතුමන් එවකට එල්.ටීටී.ඊ ත්‍රස්තවාදයට එරෙහිව පැවති සටනේ උච්චතම අවස්ථාවේදී එතුමන් දැක්වූ කැපවීම පිළිබඳ මතකයන් සිහිපත් කරන්නටද අමතක නොකළේය.



# යුද්ධ හමුදා සේවා වනිතාව වෙත පරිත්‍යාගයක්...




ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකා සේවා වනිතා ශාඛාව මගින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙත පසුගියදා රුපියල් 150,000.00 ක මූල්‍ය දායකත්වයක් ලබාදෙන ලදී. සේවා වනිතා ඒකකය විසින් රණවිරුවන් හා ඔවුන්ගේ යැපෙන්නන් වෙනුවෙන් සිදුකරනු ලබන සුබසාධන කටයුතුවලට ශක්තියක් ලබාදීම මෙහි අරමුණයි. කාන්තා බළකා සේවා වනිතා ශාඛාව මගින් පවත්වනු ලැබූ මුදල් රැස් කිරීමේ ව්‍යාපෘතින් වලින් ලද ආදායමින් මෙම මුදල් පරිත්‍යාගය සිදුකළ අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායේ ගරු සභාපතිනී රමනී දෙමටන්පිටිය මහත්මිය විසින් 2020 පෙබරවාරි 20 දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මිය වෙත අදාළ ප්‍රේෂණපත පිරිනමන ලදී. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා කාන්තා බළකායේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීඒපීඑන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී, මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්එම්ජේබී රත්නායක ආර්එස්පී, කාන්තා බළකා සේවා වනිතා ශාඛාවේ උප සභාපතිණි කුමුදු රත්නායක මහත්මිය ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# ලිය වරුණ - 2020



ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ස්වාධීන රූපවාහිනී සේවය මගින් සංවිධානය කළ ලිය වරුණ 2020 වැඩසටහන නිදහස් චතුරශ්‍ර පරිශ්‍රයේ දී 2020 මාර්තු 08 දින පවත්වන ලදී. මෙම වැඩසටහනේදී වර්තමානයේ ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලාංකික දිරිය කාන්තාවන් 06 දෙනෙකු වෙනුවෙන් විශේෂ සම්මාන පිරිනැමීමක්ද සිදුකෙරිණ.

එහිදී යුද්ධ හමුදාව නියෝජනය කරමින් කාන්තා බළකා සේවා වනිතා ඒකකයේ රාජකාරී කරන **NVQ Leval 4** සූපවේදී අංශයෙහි සහතික ලබාගෙන ඇති සෙ/6ආර්00326 කෝප්‍රල් නිශාන්ති ජේසීඅයි තම හැකියාව වෙනුවෙන් දිරියෙන් ලොව ජයගත් අපේ කාලයේ උත්තමාවියක වශයෙන් සම්මානයට පාත්‍රවිය. තවද මෙම සම්මාන පිරිනැමීමට ඇයගේ විවිධ වූ තවත් හැකියාවන් පාදක විය.



# ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...







ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබා රණක්ෂිතව දැනට රණවිරු සෙවණ - රාගම සුවසහන මධ්‍යස්ථානයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන විරෝධාර රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීමේ රෝහල් සංචාරයක් ඉකුත් පෙබරවාරි 27 දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සහ ගජබා රෙජිමේන්තු සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනිය සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම සේවා වනිතා සාමාජිකාවන් රැසකගේ සහභාගීත්වයෙන් සිදුකරන ලදී. මේ සඳහා ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එල්එච්එම් රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුලු නිලධාරීහු රැසක් ද සහභාගි වූහ.

එහිදී නේවාසික රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා භාණ්ඩ රැසක්ද පරිත්‍යාග කළ අතර, රණවිරු සෙවණ - රාගම සුවසහන මධ්‍යස්ථානයේ සනීපාරක්ෂක කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් අවැසි භාණ්ඩද එම පරිත්‍යාග අතර විය. එමෙන්ම රණක්ෂිතයට පත් විරෝධාර රණවිරුවන් ඇතුලු එහි සියලුම කාර්ය මණ්ඩලය වෙත ප්‍රණීත තේ පැන් සංග්‍රහයක් ලබාදීමටද කටයුතු කෙරිණ.

තවද එදිනම ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 13 වන වර්ෂික මහ සභා රැස්වීම ද රණවිරු සෙවණ - රාගම නිලධාරී නිවස්නයේ දී ගරු සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, එහිදී එළැඹි වර්ෂය වෙනුවෙන් නව නිලධාරී මණ්ඩලයක් පත්කර ගැනීමද සිදුවිය.



# පාබල හමුදා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ලෙස චායා ගුණරත්න මහත්මිය 2020 මාර්තු 12 දින සුභ මොහොතින් රාජකාරී ආරම්භ කරන ලදී. එම අවස්ථාව සඳහා රෙජිමේන්තු අධිපති මෙන්ම එම සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවෝ රැසක්ද සහභාගි වූහ.

# යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...



යාන්ත්‍රික පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒඑම්එස්බී අතපත්තු සහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනී ෆ්‍රෙඩ්රිකා අතපත්තු මහත්මියගේ සංකල්පයකට අනුව කාන්තා සමාජයේ පූර්ණ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ඉදිකරනු ලැබූ දෙමහල් හට නිවාසය පසුගිය පෙබරවාරි 07 දිනට යෙදුනු සුබ මොහොතින් සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් සෙසුනිලයින්ගේ පරිහරනය පිණිස විවෘත කරන ලදී.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව



සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණී ප්‍රියමාලි මුදන්නායක මහත්මියගේ සංකල්පයකට අනුව ආරම්භ කරන ලද "සිංහ දිරිමග" වැඩසටහන යටතේ 2020 සහ 2021 වර්ෂයන්හි විශ්‍රාම යාමට නියමිත සිංහ රෙජිමේන්තුවට අයත් රණවිරුවන්ගේ විශ්‍රාම දිවිය අර්ථවත් ලෙස ගතකිරීමට පදනමක් ලෙස වෘත්තීය පුහුණු වැඩසටහනක් ඉකුත් පෙබරවාරි 28 දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම් මුදන්නායක ආර්එස්පී යූඑස්පී සහ සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිණියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද එම වැඩසටහනට රණවිරුවන් 140 දෙනෙකුද සහභාගි වූහ.



අදාළ දේශනය සඳහා ගලිගමුව දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සම්පත් ආටිගල මහතා සහ එහි උපදේශක මණ්ඩලයද, යුද්ධ හමුදා වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය හා යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරමින් උපදේශකවරු පිරිසක්ද සහභාගි වූහ.

තවද එම වැඩසටහනට විවිධත්වයක් එක් කිරීම සඳහා සමාජ මාධ්‍යයන් හරහා ජනප්‍රිය වූ "ජනයි ප්‍රියයි" ශිල්පීන් දෙදෙනාද එක්වූහ. මෙම වැඩමුළුව සඳහා මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඒජී පල්ලාවල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, සිංහ සේවා වනිතා ශාඛාවේ ගරු ලේකම්තුමිය වන පද්මිණී පල්ලාවල මහත්මිය මෙන්ම සෙසු ජ්‍යෙෂ්ඨ කනිෂ්ඨ නිලධාරීන් රැසක්ද සහභාගි වූහ.

රුදුරු ත්‍රස්තවාදය මුලිනුපුටා දමා රටේ ඒකීයභාවය, ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාවය ආරක්‍ෂා කිරීමේ උදාරතර චේතනාවෙන් යුක්තව අනාගත පරපුරට නිදහස් නිවහල් දේශයක් උරුමකර දීම වෙනුවෙන් සටන් වැද සිටියදී අතුරුදහන් සෙ/409917 ලා/කෝ බංඩාර ඩීඑම්ටී යන කොනොනිගේ ලඟම ඥාතීන් වෙත පසුගියදා නිවසක් පරිත්‍යාග කෙරිණ. 7 ගැහේබ අණදෙන නිලධාරීගේ අධීක්‍ෂණයෙන් යුතුව ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය හරිෂ්මන් බන්සජායා මහත්මියගේ මඟපෙන්වීම මත ඉදිකරනු ලැබූ එම නිවස පසුගියදාට යෙදුනු සුබ මොහොතින් සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් එම ඥාතීන් වෙත භාරදෙනු ලැබීය. තවද අදාල නිවැසියන් වෙත අත්‍යාවශ්‍ය උපකරණ තොගයක් පරිත්‍යාග කිරීමද එදින සභාපතිනිය හා එහි ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් අතින් සිදුවිය.





# ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාව...








ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහ සභා වාරය එහි ගරු සභාපතිනි හරිෂ්මන් බන්සජායා මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා රණවිරු සම්පත් කේන්ද්‍රය - වත්තල හිදී පැවැත්විණ. ගැමුණු හේවා බළකායේ සේවයේ යෙදී සිටින රණවිරුවන් 40 දෙනෙකුගේ දුවා දරුවන් වෙත පොත්පත් හා පාසල් උපකරණ බෙදාදීම, වෛද්‍ය ඩිලාන් මාලින්ද මහතා විසින් හරවත් දේශනයක් පැවැත්වීම, චන්දනාලේප ආයතනය වෙතින් ජංගම බස්රථයක් තුළ රූපලාවන්‍ය කටයුතු සිදුකිරීම සහ චන්දනාලේප නිමැවුම් පිළිගැන්වීම, හයිලැන්ඩර් සහ යුද්ධ හමුදා ඒක පුද්ගල සංගීත කණ්ඩායම් විසින් සංගීත වැඩසටහනක් පැවැත්වීම, ලොතරැයි දිනුම් ඇදීම, උත්සවය සඳහා සහභාගි වූ ආරාධිත අමුත්තන් සහ සාමාජිකාවන් වෙත ත්‍යාග පිළිගැන්වීම, දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම එම වාර්ෂික මහා සභා රැස්වීමට සමගාමීව පැවැත්වුණු වැඩසටහන් අතර විය.



රණවිරුවා



# COVID - 19

## කොරෝනා බෝවීම වළක්වමු...

## ඔබ දන්නවාද?

කොරෝනා - වෛරස ආසාදනයකි
රෝගියෙකුගේ බිඳිති මඟින් බෝවේ

### කහින විට හෝ කිවිසුම් යන විට,

- අන් අයගෙන් ඉවතට හැරෙමු
- නාසය හා මුඛය ටිෂූ කඩදාසියකින් හෝ නැවූ වැලමිටේ ඇතුළු පැත්තෙන් ආවරණය කර ගනිමු
- භාවිත කළ ටිෂූ කඩදාසි වැසිය හැකි කසළ බඳුනකට දමමු
- තැන තැන කෙළ නොගසමු



### ජනතාව රැස්වන තැන්වලට නොයමු,

- කිට්ටු වී කතාබහ කිරීමෙන් වැළකෙමු (මීටර් 1 - 2 ත් අතර දුරින් සිටිමු)
- නිකරුනේ මතුපිටවල් (අගුළු, බිත්ති, අත්වැටවල්) ඇල්ලීමෙන් වළකිමු
- සංචාරවලින් වැළකී සිටිමු.



### සබන් යොදා දෑත් සෝදමු,

- කෑමට පෙර
- පිරිසක් සමඟ ගැවසීමෙන් පසු
- ගමනක් ගොස් පැමිණි පසු
- රෝග ලක්‍ෂණ ඇති අයට උවටැන් කිරීමෙන් පසු
- කිවිසුමකින්, කැස්සකින්, සොටු සීරීමෙන් පසු
- ක්‍රීඩා කිරීමෙන් පසු





### ඇස්, කට, නාසය සහ මුහුණ ඇල්ලීමෙන් වළකිමු,

### සිප වැළඳ ගැනීමෙන්, අතට අතදී ආචාර කිරීමෙන් වළකිමු



## එකමුතුව ජයගනිමු, ව්‍යසනය දුරලමු...

# සුහද හමුවක මතක සටහන්...





ඇෆ්ගනිස්ථාන ඉස්ලාමීය ජනරජයේ තානාපති එම් අෂ්රාෆ් හයිදාරි මහතා පසුගිය මාර්තු 10 දින යාපනය අර්ධද්වීපයේ සිදුකළ සංචාරය අතරතුර යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී හමුවිය. උතුරේ සිවිල් වැසියන් සවිබල ගැන්වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් වර්තමානයේ ආරක්ෂක හමුදාවන්හි කාර්යභාරය පිළිබඳ කරුණු තානාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සපැමිණි නියෝජිත පිරිස සමග පැවති එම සුහද හමුවේදී සාකච්ඡා කෙරිණ.

---

## *"Jaffna Got Talent"* ගායන හා නර්තන තරඟාවලිය...

**"Jaffna Got Talent"** ගායන හා නර්තන තරඟාවලියේ අවසන් පූර්ව වටයේ තරඟ පසුගිය මාර්තු 10 දින යාපනය ආරක්ෂක සේනා මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ.

මෙම තරඟාවලියේ පැවති අවසන් පූර්ව වටයේදී තරඟකරුවන් 20 දෙනෙකු (ගායන හා නර්තන 10 බැගින්) විශේෂඥ විනිසුරු මඬුල්ලක් සහ විශාල ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සිය දක්ෂතා ඉදිරිපත් කළ අතර, එම තරඟකරුවන් අතරින් අවසන් මහා තරඟයට ගායන හා නර්තන අංශයෙන් තරඟකරුවන් පස්දෙනා බැගින් තෝරා ගන්නා ලදී.



අවසන් පූර්ව වටයේ තරඟ දැකබලා ගැනීම සඳහා යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී, 51, 52 සහ 55 සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, ජ්‍යෙෂ්ඨ කණිෂ්ට නිලධාරීන්, යුද්ධ හමුදා සාමාජිකයින් මෙන්ම තරඟකරුවන්ගේ දෙමාපියන් ඇතුලු ප්‍රේක්ෂකයින් විශාල පිරිසක් සහභාගි වූහ.





# රන් අස්වනු නෙළීමේ මංගල්‍යයට එක්වෙමින්...

ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයේ ඇටඹගස්කඩ ශ්‍රී සුදර්මාරාම විහාරස්ථානයේ විහාරාධිපති සද්ධර්ම කීර්ති ශ්‍රී සුමන මංගල සිද්ධාර්ථ දේශකීර්ති පූජ්‍යපාද ඇටඹගස්කඩ ශ්‍රී කල්‍යාණ තිස්සාභිධාන නාහිමිපාණන්ගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ මුතුන් මිත්තන්ගේ පැරණි චාරිත්‍රයන්ට මුල්තැනක් දෙමින් මෙවර මහ කන්නයේ රන් අස්වනු නෙළීමේ උත්සවය ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී ගේ මූලිකත්වයෙන් 2020 පෙබරවාරි 17 දින ඇටඹගස්කඩ වෙල්යායේදී උත්සවාකාරයෙන් සිදුකරන ලදී.

එම අවස්ථාවට වව්නියාව දිස්ත්‍රික් ලේකම් සමන් බන්දුලසේන මහතා, 56 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජේආර්කේ සේනාරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් එම්එස් ජානක මහතා වව්නියාව දිසාව භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, සිවිල් ආරක්ෂක බලකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම ගම්වාසීන් විශාල පිරිසක් සහභාගි වූහ.



# උතුරු මැද නාවික ආඥාපති කඳවුරු සංචාරයක නිරතවෙයි...

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී ගේ ආරාධනයකට අනුව උතුරු මැද නාවික අඥාපති රියාද් අද්මිරාල් ඩීයූඑල්ජ් දිසානායක යූඑස්පී පීඑස්සී එම්පීජ් (පීඅයිඑම්-යූඑස්ජේ) පසුගිය පෙබරවාරි 15 දින ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) කඳවුරු සංචාරයක නිරත විය. එහිදී කඳවුරු සම්මාන මුරයකින් පිදුම් ලැබූ උතුරුමැද නාවික ආඥාපතිතුමන් එම කඳවුරු භූමියේ පිහිටි රණවිරු ස්මාරකය වෙත  මල් කළඹක් තැන්පත් කර මියගිය රණවිරුවන් වෙනුවෙන් පුෂ්පෝපහාර දැක්වීමටද අමතක නොකළේය.





# කොරෝනා මැඩලීමට නව සෙවණක්....




යුද්ධ හමුදාධිපති වැලිකන්ද රෝහල පරීක්‍ෂා කිරීමට පැමිණි අවස්ථාව





සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) විසින් නව නිරෝධායන මධ්‍යස්ථාන 02 ක් 2020 මාර්තු 09 දින සිට මඩකලපුව විශ්වවිද්‍යාලය - පූනානි සහ ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථානය - කන්දකාඩු හි ස්ථාපනය කර තිබුණි. පසුව ඉරානය, ඉතාලිය සහ දකුණු කොරියාවෙන් පැමිණි අයවලුන් වැඩිවීමත් සමග එම නිරෝධායන මධ්‍යස්ථාන සංඛ්‍යාව 08 ක් දක්වා වැඩිකරන ලදී. එහිදී පැය 72 ක් වැනි ඉතා කෙටි කාලයකින් සියලු අංගයන්ගෙන් සමන්විත රෝහලක් බවට වැලිකන්ද රෝහල පත්කිරීමට කටයුතු කෙරුණු අතර, ඒ සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) හට පිරිස් විසින් විශාල පරිශ්‍රමයක් දරන ලදී.

එසේ නවීකරණය කරන ලද එම රෝහල, 2020 මාර්තු 19 දින ආරක්‍ෂක සේනා මූලස්ථාන (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී සහ පොළොන්නරුව මහ රෝහලේ අධ්‍යක්‍ෂ වෛද්‍ය සම්පත් ඉන්දික කුමාර මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.



# බිලියඩ් සහ ස්නූකර් ක්‍රීඩාව පිළිබඳ වැඩමුළුවක්...





ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ සංකල්පයක් මත බිලියඩ් සහ ස්නූකර් ක්‍රීඩාව යුද්ධ හමුදා සාමාජිකයින් අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් එම ක්‍රීඩාව පිළිබඳ වැඩමුළුවක් ඉකුත් පෙබරවාරි 21 දින කිලිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථානයේදී පවත්වන ලදී.

ආරක්ෂක සේනා ආඥාපතිගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩමුළුව ජාතික බිලියඩ් සහ ස්නූකර් ක්‍රීඩා සංගමයේ තීරකයෙකු වන එස්එම් ඊබ්‍රහීම් මහතා සහ යුද්ධ හමුදා බිලියඩ් සංගමයේ උපදේශකයින් දෙදෙනෙකු විසින් මෙහෙයවන ලදී.

---

# සංචාරයක සටහන්...

ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් පෙබරවාරි 20 දින භාරතීපුරම් පාසලේ විදුහල්පති සහ නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හමුවී ඉදිරියේදී ආරක්ෂාව සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳව සාකච්ඡා කරන ලදී. එසේම කිලිනොච්චි භාරතීපුරම් යුද්ධ හමුදා රෝහල, කිලිනොච්චි නගරයේ පිහිටා ඇති ක්‍රීඩා සංකීර්ණය සහ ඉරණමඩු ගුවන් හමුදා කඳවුරද එහිදී ඔහුගේ නිරීක්ෂණයට බඳුන්විය.





# මුලතිව් ආඥාපතිගේ සේනාංක සංචාරය...

ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) නව ආඥාපති මේජර් ජෙනරාල් ජීඩබ්ලිව්ඩීකේ ජයතිලක යූඑස්පී එන්ඩීයූ සිය ආඥාපති ධූරයෙහි වැඩ භාරගැනීමෙන් පසු 59, 64 සහ 68 යන සේනාංකයන්හි සංචාරයක නිරතවන ලදී. එහිදී හෙතෙම එම සේනාංක යටතේ ඇති සියලු බළසේනා හා ඒකකවල භටපිරිස් අමතන්නටද කටයුතු කළේය. ආඥාපතිගේ එම සංචාරයේ විශේෂ මතක සටහන් මෙහි දැක්වේ.








# පීඩාවට පත් ජනතාවට සහන...

මේ දිනවල පවතින කොවිඩ් - 19 වසංගතය මැඩපැවැත්වීමේ අරමුණින් දිවයින පුරා ක්‍රියාත්මක ආරක්ෂක වැඩපිළිවෙලට සමගාමීව 68 සේනාංක බල ප්‍රදේශයේ වත්මන් තත්වය සොයාබැලීම සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ජීඩබ්ලිව්ඩීකේ ජයතිලක යූඑස්පී එන්ඩීයූ පසුගිය මාර්තු 30 දින පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ සංචාරයක නිරතවිය. එහිදී හෙතෙම ඇඳිරිනීතිය ඉවත්කළ කාලය තුළ තොග සහ සිල්ලර වෙළඳුන් සිය වෙළඳාම් කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව සොයා බලන ලදී. මෙම අවස්ථාවට 68 සේනාංකයේ සේනාංකාධිපති හා 682 බළසේනාවේ බළසේනාධිපති ද සහභාගී වූහ.






# රණවිරුවන් වෙත සහන...

සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින කොවිඩ් 19 වෛරසය පැතිරීම අවම කිරීම සඳහා යුද්ධ හමුදාව වෙතින් සිදුකරනු ලබන දායකත්වය අගය කරනු වස් 306/සී/01 දිස්ත්‍රික්කය හා කොළඹ කොටුව සිංහ සමාජය එක්ව යුද්ධ හමුදා රෝහල - පනාගොඩ වෙත භාණ්ඩ තොගයක් පරිත්‍යාග කරන ලදී. ඊට ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) බල ප්‍රදේශයේ ජීවත්වන දිළිඳු ජනතාව සඳහා වියළි ආහාර ද්‍රව්‍ය ද, යුද්ධ හමුදා රෝහල පනාගොඩ ප්‍රයෝජනය සඳහා විශේෂිත රෝහල් ඇඳන් 16 ක්, මෙට්ට, රෝද පුටු, ඇවිදීමේ ආධාරක උපකරණ, වෛද්‍ය පුටු, අත්වාරු, ව්‍යායාම උපකරණ සහ විශේෂිත මුහුණු ආවරණ ඇතුලු රෝහලට අවශ්‍ය මිලියන 2.5 ක පමණ වටිනාකමකින් යුත් වෛද්‍ය උපකරණ තොගයක් ද අයත් විය.




ජාත්‍යන්තර සිංහ සමාජයේ 306/සී/01 සිංහාධිපති සිංහ මහින්ද පෙරේරා සහ කොළඹ කොටුව සිංහ සමාජයේ නියෝජිතයින් පිරිසක් විසින් ඉකුත් මාර්තු 27 දින අදාළ පරිත්‍යාග නිල වශයෙන් ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ වෙත භාරදෙන ලදී.



# කොරෝනා මැඩලීමට සහයවෙමින්...





කටුනායක ගුවන් තොටුපල වෙත විදේශ රටවලින් පැමිණෙන අයවලුන් නිරෝධායන ක්‍රියාවලියට යොමු කිරීම සිදුකරන ලද අතර, එම කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඉකුත් මාර්තු 16 දින ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ 14 සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති ඇතුලු නිලධාරීන් පිරිසක් සහභාගි වූහ.

# “Commando Footslog” සාර්ථකව නිමාවෙයි...




**“Commando Footslog 2020”** කමාන්ඩෝ රෙජිමේන්තුවේ 40 වන සංවත්සර සැමරුම පසුගිය මාර්තු 08 දින අති විශාල ප්‍රේක්ෂකයින් පිරිසක් මධ්‍යයේ ගාලුමුවදොර දී පැවැත්විණ. මෙම කූටප්‍රාප්තියට ප්‍රථම දිවයිනේ ප්‍රධාන නගර තුනක් වන මහනුවර, හලාවත සහ ගාල්ල ආවරණය වන පරිද්දෙන් කමාන්ඩෝ සෙබලුන්ගෙන් සමන්විත කණ්ඩායම් මෙම සංවත්සර දිනට සමගාමීව විශාල ප්‍රේක්ෂකයන් පිරිසකගේ ආශිර්වාදයෙන් පා ගමනින් සැතපුම් සිය ගණනක් පසු කරමින් රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත පැමිණීමද විශේෂිත සිදුවීමක් විය.



ගාලුමුවදොර පිටියේ පැවති මෙම උත්කර්ෂවත් අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 57 සේනාංකයේ සේනාංකාධිපති මෙන්ම කමාන්ඩෝ රෙජිමේන්තුවේ අධිපති මේජර් ජෙනරාල් බීපීඑස් ද සිල්වා ආර්එස්පී ගේ ආරාධනයෙන් වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මියද සහභාගි වූහ.



මෙම සංවත්සර සැමරුමේදී ලක්දෙරණ එක්සේසත් කිරීම වෙනුවෙන් සටන් වැද දිවි පිදූ නිලධාරීන් 43 ක් සහ සෙසු සාමාජිකයින් 689 ක් සිහිපත් කිරීමටද අමතක නොකළේය.

මෙම අවස්ථාව වර්ණවත් කරමින් කමාන්ඩෝ භටයින්ගේ සුවිශේෂි කුසලතා, නොපසුබට උත්සහය, ධෛර්යය සහ අධිෂ්ඨානය පිළිබිඹු කරමින් ප්‍රාන ඇපකරුවන් නිරුපද්‍රිතව නිදහස් කරගැනීම සඳහා ඉතා සූක්ෂම පුහුණු මෙහෙයුමක් දියත් කිරීම, නගරබද සටන් ශිල්පීය ක්‍රම, හෙලිකොප්ටරයක සිට කේබල් ආධාරයෙන් අදාළ ස්ථානයන්ට ළඟාවීම, කිමිදුම් සටන් කුසලතාවන්, ස්නයිපර් කුසලතා, හෙලි රැප්රලින් ශිල්පීය ක්‍රම සහ නිරායුධ සටන් ක්‍රම ඇතුළත් මනා සංදර්ශනයන් ඉදිරිපත් කරමින් රැස්ව සිටි ප්‍රේක්ෂක පිරිස අමන්දානන්දයට පත් කළහ.





# බුහුමන් මැද තැනූ අභිමන් සෙවණක්...





යුද්ධ හමුදාවේ පැරණිතම රෙජිමේන්තුව වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ පනාගොඩ පිහිටි රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකළ තෙමහල් ගොඩනැගිලි සංකීර්ණය ඉකුත් මාර්තු 02 දින විවෘත කෙරිණ.

බටහිර ආරක්ෂක සේනා ආඥාපති මෙන්ම ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ආරාධනයකට අනුව ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සපැමිණි වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් එලෙස විවෘත වූ ගොඩනැගිලි සංකීර්ණයට සෙසුනිල භෝජනාගාරයක්, ආපනශාලාවක් සහ අති නවීන පහසුකම්වලින් සමන්විත ශ්‍රවණාගාරයක්ද අයත් විය.





# සුහද හමුවක්...



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ හා ඉන්දියානු යුද්ධ හමුදාවේ බ්‍රිගේඩියර් අරුන්කුමාර් භාරාජ්වාජ්, කර්නල් මුදිත් මහාජන් අතර හමුවක් ඉකුත් මාර්තු 05 දින සිදුකෙරිණ.

ආරක්ෂක සේනා මූලස්ථානයේදී සිදුවූ මෙම හමුව අවසානයේ සංචාරයේ නිරත එම ජ්‍යෂ්ඨ නිලධාරී වෙත ආරක්ෂක සේනා ආඥාපති විසින් සමරු තිලිණ ප්‍රදානයක්ද සිදු කරන ලදී.



# සංවත්සර දිනය අභිමානවත්ව සමරමින්...





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) 07 වන සංවත්සරය 2020 මාර්තු 14 දින අභිමානවත්ව සමරනු ලැබීය.

එහිදී ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ වෙත කඳවුරු සම්මාන මුරයක් සහ සම්මාන ආචාර පෙළපාලියක් පිරිනමමින් ඇරඹි අභිමානවත් සැමරුම් උත්සව කටයුතු අතරට සියලු නිල දිවා භෝජන සංග්‍රහයක්, සර්ව රාත්‍රික පිරිත් දේශනයක් සහ මහා සංඝරත්නය වෙත හීල් දානය පිළිගැන්වීමේ ආගමික වැඩසටහනක්ද එකතුව තිබිණ. තවද රණවිරු රියල් ස්ටාර් ගායකයින් සමග මුතුකුමරු ක්‍රීඩාංගනයේ පැවති සංගීත ප්‍රසංගය ද සංවත්සර දිනය වර්ණවත් කළ අංගයක් විය.




## හාරය ඔප්පු කිරීම...

**දෙවියන්** - ළමයා ඔබ විභාගය ඉහළින් සමත් වූවා නේද...?

**චමීර** - ඔව්... ඔබ කවුරුන්ද...?

**දෙවියන්** - මම ඔබට විභාගය සමත්වීමට උපකාර කළ දෙවියන්... වහාම ඇවිත් භාරෙ ඔප්පු කරපං...





## ෆේරවීම...

**වයලට්** - තමුසෙ ඊයෙ පාටියෙදි බීල මටත් එක්ක ලැජ්ජ කලා මනුස්සයො...

**විල්සන්** - ඇයි මං මොකක්ද කලේ...?

**වයලට්** - තමුසෙ තමුසෙගෙ ෆෝන් එකේ ෆ්ලෑෂර් එක පත්තු කරන් තමුසෙගෙ ෆෝන් එකම නැතිවෙලා කියල පැයක් තිස්සෙ හෙව්ව ඕයි...

## ක්‍රම සීයෙන් එකක්...

**යාචකයා** - අනේ මහත්තයෝ... මම මෙහෙම හිඟා කෑවට පොත් ගත්කරු කෙනෙක්... මම තමයි මුදල් උපයන ක්‍රම 100 කියන පොත ලිව්වේ...

**මහත්මයා** - එහෙනම් ඇයි තමුසෙ මේ විදියට හිඟා කන්නෙ...

**යාචකයා** - මේකත් ක්‍රම සීයෙන් එකක් තමයි මහත්තයෝ...



## සැබෑ ආදරය...

**සඳුනි** - හෙලෝ බබා...

**කසුන්** - හෙලෝ කවුද මේ කතා කරන්නේ...?

**සඳුනි** - මේ මම අනේ...

**කසුන්** - කවුද කියන්නකො ඉතිං...

**සඳුනි** - මේ ලෝකෙන් ඔයා වැඩියෙන්ම ආදරේ කරන කෙනා...

**කසුන්** - බොරු කියන්න එපා... අරක්කුවලට කතා කරන්න බෑ...





## සුරංගනා කතා...

**නිමල්** - මහත්තයා... මෙතන තියෙනවද අර සැමියා බිරිඳගේ දෙවියාය කියන අලුත් පොත?

**පොත් සාප්පු හිමිකරු** - අර එහා පැත්තෙන් අහල බලන්න මහත්තයා... සුරංගනා කථා තියෙන්නෙ ඒ පැත්තෙ රාක්කවල විතරයි...

# කැපවීම, දරාගැනීම හා අරමුණින් බැහැර නොවීමේ වැදගත්කම



" සටන කොතරම් අවාසි දායක වුවද කිසිවක් ලෙහෙසියෙන් අතහරින්නට එහි සෙබලු ඉඩ නොදුන්හ. **MPMG** අවියක්ද රැගෙන ආරක්ෂක බැම්මට වන් කෝප්‍රල් පුෂ්පකුමාර කඳවුර මධ්‍යයේ ඇති මාර්ගය හරහා මාරුවෙන ත්‍රස්තවාදීන් හට ප්‍රහාර එල්ල කරන්නට විය. එයින් සැලකිය යුතු බලපෑමක් ඔවුනට එල්ල වුවද එම ක්‍රියාවේ අඛණ්ඩව නියැලෙන්නට ඔහුට අවකාශ නොවීය. කඳවුර තුළ වූ දෙමහල් ගොඩනැගිල්ලක ඉහළ මාලයේ සිට එල්ල වූ "ස්නයිපර්" ප්‍රහාරයක් ඔහුගේ නළලත සිදුරුව ගියේ ඔහුව අඩි කිහිපයක් හුන් තැනින් ඉවතට වීසිකර දමමිනි. පස් බැම්ම අසල බිම ඇද වැටුණු පුෂ්ප කුමාරගේ නළලින් රුධිරය ගලා යන්නට වූයේ කරාමයකින් දිය වෑහෙන්නා සේය. ගිනියම්ව දුම් දමන සිය **MPMG** අවිය ඒ මොහොතේදීත් සතුරා දෙසට හැරවී තිබුනද එය තවදුරටත් ක්‍රියාත්මක කිරීමට එහි කිසිවෙකුත් නොවීය. සිය දෑස් අබිමුව වූ එම සිදුවීම යාබද බංකරයේ හිඳ බලා සිටි කපිතාන් ගුණතිලක සේම කෝප්‍රල් අජිත් රෝහණ තුළ ද ඇති කලේ දැඩි කම්පනයකි. ඔවුනට තවදුරටත් තම සගයා වෙනුවෙන් යමක් නොකර සිටීමට නොහැකි විය. " අපි කොහොම හරි පුෂ්ප කුමාරව බංකරයට ගේන්න ඕන" කෝප්‍රල් අජිත් රෝහණ හමුවේ එහිදි කපිතාන් ගුණතිලක පවසන්නට වූයේ දැඩි ස්වරයකිනි.

සුළං කපා පැමිණෙන වෙඩි ප්‍රහාර මධ්‍යයේ ඔවුහු පුෂ්ප කුමාර වැටී සිටි ස්ථානය කරා බඩගාන්නට වූහ. නමුත් එකවර ඇදි ආ වෙඩි උණ්ඩයක් කපිතාන් ගුණතිලකගේ හිසෙහි වම් පස යන්තමින් ගෑවී ඉවත යන්නට වූයේ ඔහුගේ ගමන වළකාලමිනි. එම උණ්ඩයෙන් ඔහුගේ හිසෙහි පැත්තක සම ප්‍රදේශයට හානි වූව ද එය බරපතල තත්වයක් නොවීමට තරම් ඔහු වාසනාවන්ත විය. එහිදී පුෂ්ප කුමාර වෙනුවෙන් දැරූ උත්සාහය අතරමග නවතා කපිතාන් ගුණතිලක බංකරය වෙත ගෙන ඒමට කෝප්‍රල් අජිත් රෝහණට සිදුවිය. නමුත් අවාසනාව තවමත් ඔවුන් අතහැර නොගොස් තිබිණි. බංකරයට පැමිණි සැනින්ම ප්‍රදේශය දෙදරවමින් එහි වහලය මතට වැටුණු කාලතුවක්කු උණ්ඩයකින් එහි සිටියවුන් අන්දමන්ද කරවිය. එතෙක් වේලා කඳවුර සමීපයේ පුපුරා ගිය කාලතුවක්කු උණ්ඩ දැන් දැන් කඳවුරු පරිශ්‍රයට පතිත වන සෙයක් පෙනෙන්නට විය. එම ප්‍රහාර කුමන පාර්ශවයකින් එල්ල කරන්නේ දැයි එහි සිටිය වුන්ට නිශ්චිත නොවීය.

බංකරය අසල වූ යුධ අගලක **(Trench)** බැස සිටි කෝප්‍රල් අජිත් රෝහණ සමීපයේ තම ඒකක මූලස්ථාන කාර්යාලයේම සේවය කරන සැරයන්වරයෙකු ද විය. හදිසියේ ඔවුන් දෙදෙනාට යාබදව කාලතුවක්කු උණ්ඩයක් පුපුරා යන්නට වූයේ ප්‍රදේශය දෙවනත් කරමිනි. එම පිපිරීමත් සමගම එහි සිටි සැරයන්වරයාගෙන් දිස් වූයේ අමුත්තකි. ඔහුගේ සිරුරේ කිසිදු තුවාලයක් දක්නට නොලැබුන ද කෝප්‍රල් අජිත් රෝහණ ඉදිරියේදීම ඔහු අවසන් හුස්ම හෙළීය. ඇති වූ කම්පනය නිසාවෙන්ද නොඑසේනම් වෙනත් හේතුවක් නිසා ඔහුගේ මරණය සිදුවුනේදැයි එහිදී අජිත් රෝහණට

**අද අපට තියෙන්නේ තෝරා ගැනීම් දෙකයි යහමින් කලා බීලා, නිදහසේ එහෙ මෙහෙ ඇවිදලා, තාවකාලික සතුටක් විඳලා මේ කොරෝනා හදාගෙන නිකරුනේ මැරිලා යනවද. එහෙම නැත්තම් මොන දුෂ්කරතාවයක් හරි විඳගෙන රටක් හැටියට මේ වසංගතයෙන් බේරිලා කෙටිකාලයකින් ආපසු නැගිටිනවාද කියන එකයි.**

සිතාගත නොහැකි විය. මේ අතර එහි බංකරයක සිටි කෝප්‍රල් මල්ලව සිය අවියද රැගෙන කෝප්‍රල් පුෂ්ප කුමාර වැටී සිටි තැනට දිව යන්නට වූයේ ඉදිරියට එන ත්‍රස්තවාදින් නවතාලන්නට වඩාත්ම සුදුසු තැන එහි වූ නිසාය. නමුත් ඔහුට ද පුෂ්ප කුමාරට අත්වූ ඉරණමට ගොදුරු වන්නට එතරම් වේලා ගත නොවුණි."

(යුද හමුදා මූලස්ථානයේ අනුමැතියෙන් නුදුරේදී එළි දැක්වීමට නියමිත "මරණය මැදින් මුලතිව් සිට" කෘතියෙනි.)

මේ ලිපියට ඉහත උපුටා ගැනීම ඉදිරිපත් කරන්න හිතුවේ එහි අන්තර්ගතය වර්තමානයටද ගැළපෙන හින්දයි. කැපවීම, දරාගැනීම හා අවසානය තෙක් අරමුණින් බැහැර

නොවීම කියන කාරණා අද අපේ රටේ සාමාන්‍ය ජනතාවටත් ඒත්තු ගන්වන්න අවැසි වේලාවක් මේක.

වර්තමානයේ අපි මුහුණදීල තියෙන අභියෝගය ඉතිහාසයේ මෙතෙක් අත්නොවිඳි එකක්. එය අලුත් වගේම වෙනස් තත්වයක්. මේ වසංගතය අපේ රටේ ඔලුව උස්සන්න හදපු මුල් අවස්ථාවේ ඉඳන් ඊට මුහුණදීමේ අභියෝගයේ වැඩි බරක් පැටවුණේ යුද්ධ හමුදාවටයි. ඒ අනුවයි යුද්ධ හමුදාපතිතුමාගේ මූලිකත්වයෙන් රටපුරා "කොරෝනා" ව්‍යාප්තියට වැටබැඳීමේ දැවැන්ත ක්‍රියාන්විතයක් සෞඛ්‍ය අමාත්‍යංශයේ සහයෝගය ඇතිව ඇරඹුණේ.

එදා ඉඳන් මේ වෙනකල් රණවිරුවෝ එක සීරුවට ඒ වෙනුවෙන් වැඩ. සමාජ මාධ්‍යවල විද්‍යුත් නාලිකාවල ඒ පිළිබඳ විටින් විට තොරතුරු රූප රාමු එක්කම පළවුනාට එහෙම නිරාවරණය නොවුණු තිරය පිටුපස රණවිරුවන් ඉටුකරන අප්‍රකට මෙහෙවර බොහොමයි. ඔවුන්ගේ නිදිවැරූ දෑස් මෙන්ම දහඩිය සුසුම් මේ දැවැන්ත ක්‍රියාදාමය ඇතුලේ දෝරෙ ගලනවා.

අපේ හමුදවේ තියෙන ශක්‍යතාවයන් සියල්ල අද වන විට මේ ව්‍යසනයෙන් ගොඩ එන්න යොදවා තියෙනවා. බලය, ශ්‍රමය, තාක්ෂණික හැකියාවන්, ශිල්පීය දැනුම, නිර්මාණශීලිත්වය එකට මුසු කරල අසීමිතව සේවය කරන්න හමුදාව පෙරට ඇවිත්. හරියටම කිව්වොත් සිත කය වචනය තුනෙන්ම හමුදාව මේ වැඩේට බැහැලා.

"කොරෝනා" කියන්නේ යුධමය මැදිහත් වීමකින් විනාශ කළ හැකි ත්‍රස්තවාදයක් හෝ අන්තවාදයක් නෙවේ. අවි බලයෙන් හෝ වෙනත් සංග්‍රාමික හැකියාවන්ගෙන් මේ සටන දිනන්න පුලුවන්නම් මේ වෙද්දි අපි ඒක කරල ඉවරයි. මොකද ඒ තරමට දක්ෂ හමුදා නායකත්වයක් වගේම අත්දැකීම් බහුල සේනාවක් තවම අපට ඉන්නවා. ඒ නිසා ජනතාව මේ යථාර්ථය අවබෝධ කරගත යුතුමයි.

යුද්ධයක් නොවුනත් හමුදාව මේ තීරණාත්මක අවස්ථාවට මැදිහත් වෙන්නේ ඇයි කියලා කෙනෙක් හිතන්න පුලුවන්. හමුදාවක තියෙන සාමූහික ශක්තිය, විනය, කිසියම් යහපත් පොදු අරමුණක් වෙනුවෙන් තම භටපිරිස මෙහෙයවීමට එහි නායකත්වයට ඇති හැකියාව අනුව බලනකොට සමාජයේ සෙසු සංවිධානයකට කණ්ඩායමට වඩා හමුදාව ඉන්නේ ගව් ගානක් ඉස්සරහින්. රජය උනත් මේ වගකීම් හමුදාවට පවරලා තියෙන්නෙම ඒ විශ්වාසය මත පදනම්වයි. ඉතිහාසයේ ඉඳන්ම හමුදාව ඒ විශ්වාසය බිඳුවකින් හෝ පලුදු වෙන්න ඉඩ දීල නැහැ. ත්‍රස්තවාදය, සුනාමි, ගංවතුර, නියඟ, නායයෑම්, අන්තවාදී ප්‍රහාර වැනි අවස්ථා වලදී හමුදාව ඒ බව ප්‍රායෝගිකව පෙන්වා දීල තියෙනවා.

නමුත් ප්‍රශ්නය තියෙන්නේ හමුදාවේ දක්ෂතාවය හා කැපවීම මත පමණක් මේ සටන ජයගන්න බැහැ. ඒකට ජනතා සහය අත්‍යවශ්‍යයි. ඒ නිසා සම්ප්‍රදායික ජනතා ආශිර්වාදයට වඩා අපිට ඕනේ ඔවුන්ගේ සහයෝග යයි. ඒ වගේම අවංකභාවය හා කැපකිරීමයි. කැපකිරීම කියලා අදහස් කළේ ජීවිත පරදුවට තියන්න නෙමෙයි. නිවසටම වෙලා ඉන්න එක, සෑම විටම සමාජ දුරස්ථභාවය තබාගන්න එක, අත්සෝදන එක, මුඛ ආවරණ පළඳින එක වගේ සරල කාරණා.

රණවිරුවො කරන කැපකිරීම් වලින් අංශු මාත්‍රයක්වත් අද ජනතාවට කරන්න වෙන්නෙ නැහැ. ගෙවුණු තිස් අවුරුදු යුද්ධය තුළ තම ජීවිත අවදානම නොතකා රණවිරුවො කළ කැපකිරීම් වල ස්වභාවය තේරුම් කරලා දෙන්න. පෙර සඳහන් කෘතියෙන්ම මේ කොටසත් උපුටා දක්වන එක හොඳයි කියලා හිතුනා.

"සමස්තයක් ලෙස ප්‍රදේශය පුරා ඒ වන විටද තුවාලකරුවන් 200 කට වැඩිපිරිසක් සිටි අතර ඔවුනට කිසිදු ප්‍රතිකාරයක් ලබාදීමට අවස්ථාවක් එහි නොවීය. එසේ තුවාල ලැබූවන් සියලු දෙනා යාබද ගොඩනැගිල්ලක් අද්දර දමා තිබූ අතර බරපතල තත්වයේ පසු වූවන් සේම සුලු තුවාල ලැබූවන්ද එහි වූහ. මේ සියල්ල අතරේ මූලස්ථානයේ ආරක්ෂක වළල්ලේ බලය තවදුරටත් රැකගැනීමට එහි සිටි සෙබලුන් වෙර දැරූහ.

ඇතැම් සෙබලුන් එහි නිර්භීතව සටන් වදිනු පෙනිණ. තම ආසන්නම සගයා ඇස් ඉදිරිපිටම තුවාල ලබා හෝ මියයද්දීත් පසු නොබා සිටි ඔවුහු සමූහයක් ලෙස එක්ව සතුරාට මුහුණ දෙන්නට අසීමිත උත්සහයක නිරත වෙමින් සිටියහ. එහිදී සිදු වූ අවාසනාවන්ත සිදුවීම නම් ඉතා සුලු තුවාල ලැබූවන් පවා සටන් බිමෙන් ඉවත්ව පිටුපස සිටි තුවාලකරුවන් හා එක්වීමය. මොහොතින් මොහොත තුවාල ලැබූවන් එසේ පසුපසට යද්දී ආරක්ෂක වළල්ලේ ඇතිවන හිඩැස් පිරවීමට එහි සටන් වදිමින් සිටින ඉතිරි වූ සෙබලුන්ට ක්‍රමයක් නොවීය. මේ අතර තුවාල ලැබූ පිරිස 300කට ආසන්නවූ අතර ඔවුන් සියල්ල එහි වූ අතැර දැමූ ගොඩනැගිල්ලක පහත මාලයේ තැන තැන වැතිරී සිටියහ. එහි සිට ඉදිරියේ සටන් වදින්නන් හා සබඳතාවයක් නොවූ අතර ඔවුනගේ අපේක්ෂාව වී තිබුණේ කොයියම් හෝ මොහොතක සහායක භට පිරිස් පැමිණ තමන්ව ගළවා ගනු ඇති බවය.

සෙබළ ගුණතිලක ඒ වන විට සිටියේ තුවාල ලැබුවන් අතරය ඔහුගේ පාදයකට තුවාල සිදුව තිබුණු නමුත් බරපතල තත්වයේ නොවීය. එහි සිට ඉදිරිය විපරම් කරද්දී ඔහුට සටන් පෙරමුණෙහි සිදුවන කිසිදු දෙයක් පිළිබඳව පැහැදිලි කරගත නොහැකි විය. යම් හෙයකින් ඉදිරි ආරක්ෂක වළල්ල බිඳ ත්‍රස්තවාදීන් ඊට ඇතුලු වුවහොත් ඔවුන්ට තමා ඇතුලු තුවාල ලැබූවන් ආසන්නයටම පැමිණීමේ පැහැදිලි ඉඩක් පවතින බව සෙබළ ගුණතිලකට අවබෝධ විය. තුවාලකරුවන්ගේ ජීවිත ආරක්ෂාව පවතිනුයේ ඉදිරියේ සටන් වදින තම මිතුරු පාර්ශවය මතය. ඔහු දෙපස විපරම් කර බැලීය. බිම වැතිර සිටින බරපතල තුවාලකරුවන් අතර පාදයකට ඇඟිල්ලකට එසේ නොමැතිනම් සිරුරේ වෙනත් තැනකට සුලු තුවාල ලැබීම හේතුවෙන් වැඩි දෙනෙකු එහි සිටින බව ඔහු දුටුවේය. ගුණතිලක සිය අවියද රැගෙන හුන් තැනින් නැගිට්ටේය. තුවාල ලත් පාදයේ දූනෙන තරමේ වේදනාවක් තිබුණද පවත්නා තත්වයේ බරපතලකම වටහාගෙන සිටි ඔහු ඉන් නික්ම ඉදිරියේ සටන් වදින තම සහයකයින් හා එක්වීමට තීරණය කළේය.

විශේෂයෙන්ම සටන් කළ හැකි මට්ටමේ අයවලුන් තමාට සිදු වූ සුලු තුවාල හේතුවෙන් පසු පසට යාම නිසා පෙරමුණේ සටන්වදින තම සහෝදර සෙබලුන්ගේද චිත්ත ධෛර්යය බිඳ වැටෙන බව සාමාන්‍ය සෙබළෙකු වුවද ගුණතිලකට තේරුම් ගත හැකි විය. උද්ගතව ඇති තත්වය පිළිබඳ පැහැදිලිව අවබෝධ කොටගෙන තිබූ ඔහු තමා සිමීපයේ සිටි එසේ සුලු තුවාල ලැබූවන් අමතා තමන් සමග ආරක්ෂක වළල්ලට එන්නැයි බලකර සිටියේය."

("මරණය මැදින් මුලතිව් සිට")

කෘතියෙනි.)

ඉහත උපුටා ගැනීම් හරහා කියන්න උත්සහ කළේ ජීවිතය සම්බන්ධ තීරණාත්මක අවස්ථාවලදී රණවිරුවෝ කොතරම් කැපකිරීමක් කළාද කියන එකයි. කැපකිරීමක් කියනනේ තියෙන සාමාන්‍ය තත්වයෙන් එහාට සිදුකරන දේකටයි. එය තමාට අවාසියක්, අපහසුතාවක් වෙන්න පුලුවන්. නමුත් සමස්තය ගැන හිතලා එහි අවසන් ප්‍රතිඵලයෙන් සිදුවන යහපත ගැන හිතලා ඒක දරාගන්න පුලුවන් වෙන්න ඕනෙ. සටන් බිම තුළ ඉහත උදාහරණ පෙන්නුවේ ඒකයි.

අද අපට තියෙන්නේ තෝරා ගැනීම් දෙකයි. යහමින් කලා බීලා, නිදහසේ එහෙ මෙහෙ ඇවිදලා, තාවකාලික සතුටක් විඳලා මේ කොරෝනා හදාගෙන නිකරුනේ මැරිලා යනවද. එහෙම නැත්තම් මොන දුෂ්කරතාවක් හරි විඳගෙන රටක් හැටියට මේ වසංගතයෙන් බේරිලා කෙටි කාලයකින් ආපසු නැගිටිනවද කියන එකයි. අපි තාම පරක්කු නැහැ. ඔබ ඔබේ කොටස ඉටුකරන තෙක් හමුදාවේ අපි අපේ සටන අත් හරින්නේ නැහැ.




මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ

## විශේෂ බළකා රෙජිමේන්තුවෙන් විශේෂ සත්කාරයක්...




මාතලේ, නාවුල විශේෂ බළකා රෙජිමේන්තුවේ සාමාජිකයින් විසින් දිවයිනේ උද්ගතව ඇති වසංගත තත්වය හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ ඇල්කඩුව ගම්මානයේ විවිධ දුෂ්කරතා මධ්‍යයේ ජීවත්වන පවුල් 23 කට වියළි ආහාර සලාක මලු සහ එළවළු පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් මාර්තු මස 30 දින දියත් කරනු ලැබීය. කොවිඩ් - 19 වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා දිවයින පුරා පනවා ඇති ඇඳිරිනීතිය හේතුවෙන් දෛනිකව ආදායමක් උපයා ගැනීමට අපහසු ජනතාවට සවියක් ලබාදීම රණවිරුවන්ගේ මෙම සත්කාරයේ අරමුණ විය. ඒ අනුව පවුල් 23 කට අයත් 78 දෙනෙකු වෙනුවෙන් මෙම සලාක පාර්සල් බෙදාදීම සිදු කෙරුණු අතර, මෙම මානුෂීය ව්‍යාපෘතිය සඳහා විශේෂ බළකා රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුලු සාමාජිකයන් රැසක්ම සහභාගී වූහ.

## සම්පත්නුවර ප්‍රදේශවාසීන්ට රණවිරු සත්කාරයක්




ඇඳිරිනීතිය පැනවීම හේතුවෙන් වැලිඔය සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගජබාපුර, මායාවැව සහ මොණරවැව යන ගම්මානවල ජනතාව සිය දෛනික අවශ්‍යතාවන් වෙනුවෙන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලදී ගැනිමේදී විවිධ දුෂ්කරතාවයන්ට ලක්ව සිටී. එම ප්‍රදේශවාසීන් වෙනුවෙන් 62 වන සේනාංකයේ උපදෙස් මත මැදවච්චිය බහුකාර්ය සමූපකාර වෙළඳසැල්හි සහයෝගයෙන් 621 වන බළසේනාවේ සහ 14 වන (ස්වේච්ඡා) පාබල හමුදාවේ හටපිරිස් විසින් සහන මිලකට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය අලෙවි කිරීමේ ජංගම වැඩසටහනක් පසුගියදා දියත් කරනු ලැබීය.

## විරු දෑතින් සරණක්...





වවුක්කොඩෙයි හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල ආක්ෂි සායනයක් පවත්වමින් අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ඇස් පරීක්ෂා කොට ඇස් කණ්ණාඩි පරිත්‍යාග කිරීමේ සුබසාධන ව්‍යාපෘතියක් ඉකුත් මාර්තු 09 දින යාපනය අරාලි සරස්වතී පාසල් පරිශ්‍රයේදී පැවැත්විණ. යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය සහ 513 බලසේනාව එක්ව සංවිධානය කළ මෙම ඇස් කණ්ණාඩි බෙදාදීම සඳහා ජාතික භාෂා ආයතනයේ සභාපති පාලිත හේවාමුදලි මහතා විසින් අනුග්‍රහය දක්වන ලදී.

## "තුරුලිය වෙනුවෙන් අපි" රුක් රෝපණ වැඩසටහන...



542 බලසේනාවේ හට පිරිස් සහ කොළඹ දේවි බාලිකා විද්‍යාලයේ සිසුවියන් ගේ සහභාගීත්වයෙන් ශ්‍රීනාත් නගර් ප්‍රදේශයේදී "තුරුලිය වෙනුවෙන් අපි" තේමාව යටතේ රුක්රෝපණ වැඩසටහනක් ඉකුත් පෙබරවාරි 14 දින සිදුකරන ලදී. මෙම රුක් රෝපණ වැඩසටහන පැවැත්වීම සඳහා දේවි බාලිකා විද්‍යාලීය ගුරු භවතුන් දෙදෙනෙකු සහ සිසුවියන් 44 දෙනෙකු සහභාගි වූහ. ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපතිගේ උපදෙස් හා මගපෙන්වීම මත 54 සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑස්ඩී වැලිකල ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ මෙම කටයුතු සිදුවිය.

## ටෙනිස් පුහුණු වැඩමුළුවක්...

කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපතිගේ උපදෙස් අනුව ටෙනිස් පුහුණු වැඩමුළුවක් ඉකුත් පෙබරවාරි 29 දින ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චි) ටෙනිස් ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී. ශ්‍රී ලංකා ටෙනිස් සංගමයේ සාමාජික සහ කිලිනොච්චි දිස්ත්‍රික් නියෝජ්‍ය පොලිස්පති දමයන්ත විජය ශ්‍රී මහතා විසින් එම වැඩමුළුව මෙහෙයවන ලදී.



# නව නිපැයුම් නිර්මාණකරණය පිළිබඳ දේශනයක්...





ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින්ගේ නව නිර්මාණ හා කුසලතා විදහා දැක්වීම වෙනුවෙන් නව නිපැයුම් නිර්මාණකරණය සහ පේටන්ට් බලපත්‍ර ලබාගැනීම වෙනුවෙන් වූ දේශනයක් පසුගිය පෙබරවාරි 20 දින ආරක්ෂක සේනා මූලස්ථාන (මුලතිව්) දේශන ශාලාවේදී පැවැත්විණ. මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූගේ උපදෙස් පරිදි පැවැත්වූ මෙම දේශනය ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය යන ආයතනයන්හි දේශකයින්ගේ සහභාගීත්වයෙන් සිදුකරන ලදී. මේ සඳහා නිලධාරී 30 දෙනෙකු හා සෙසුනිලයින් 100 දෙනෙකු සහභාගි වූහ.

## 11 වන සංවත්සරය අභිමානවත්ව සමරමින්



682 බළසේනා මූලස්ථානයේ 11 වන සංවත්සරය ඉකුත් පෙබරවාරි 15 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් බළසේනාධිපති බ්‍රිගේඩියර් එස් කස්තුරිමුදලි ආර්එස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ වැඩසටහන් මාලාවක් සිදුකරන ලදී. එහිදී ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් ඇරඹි කටයුතු අතර, බළසේනාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් පැවැත්වීම, රුක් රෝපණය, සියලු නිල තේ පැන් සංග්‍රහය සහ දිවා භෝජන සංග්‍රහය ප්‍රධාන විය. තවද සියලු දෙනාගේ රසාස්වාදය වෙනුවෙන් පැවති සංගීත ප්‍රසංගයද සංවත්සර දින වැඩසටහන් අතර කැපීපෙණුනි.

## ජන දිවියට විරු සත්කාර...



දැනට රට පුරා පැතිර යන කොවිඩ් - 19 වසංගතයෙන් පීඩාවට පත්ව සිටින 65 වන සේනාංක බළ ප්‍රදේශයට අයත් දුප්පත් පවුල් සඳහා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් 2020 මාර්තු මස 22 දින සිදු කරන ලදී. මෙම වැඩසටහන 651, 652 සහ 653 වන බළසේනාධිපතිවරුන්ගේ අධීක්ෂණය යටතේ 10, 19, 20 පාබල හමුදා රෙජිමේන්තු, 20 වන (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව සහ 7 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව විසින් සංවිධානය කරන ලදී.



65 වන සේනාංකයේ භටපිරිස් විසින් තුනුක්කායි සහ උයිලන්කුලම් ප්‍රදේශයේ තෝරාගත් අඩු ආදායම්ලාභි පවුල් 25 කට වියළි සලාක මළු සහ නැවුම් එළවළු බෙදාදීමේ කටයුත්තක් 2020 මාර්තු මස 31 දින සිදුකරන ලදී. මෙම වැඩසටහන කිළිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථාන ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ මඟපෙන්වීම මත 65 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණයෙන් සිදුවිය.

## ලිපිකරු දැනුම වර්ධනයට වැඩමුලුවක්...





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපතිගේ උපදෙස් මත මධ්‍යම බළ ප්‍රදේශයේ රාජකාරී නියුතු සෙසුනිලයින්ගේ ලිපිකරු දැනුම වර්ධනය කිරීමේ අරමුණින් යුතුව සංවිධානය කෙරුණු ලිපිකරු වැඩමුලුවක් ඉකුත් පෙබරවාරි 24 දින සිට මාර්තු 05 දින දක්වා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) දේශන ශාලාවේදී පවත්වන ලදී. මේ සඳහා සෙසුනිලයින් 21 දෙනෙකු සහභාගි වූ අතර, වැඩමුලුවේ අවසාන දේශනය සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) කර්නල් (ප්‍රමා) කර්නල් කේඩීඑම්එල් සමරදිවාකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගි විය.

## අවතැන්වූ ජනයාට සහන සලසයි...





23 සේනාංකයේ සේනාංකාධිපතිගේ උපදෙස් මත 231 බළසේනාවේ භට පිරිස් විසින් ගංවතුරෙන් පීඩාවට පත් උන්නච්චි ප්‍රදේශයේ අසරණ පවුල් 250 කට අවශ්‍ය ඇඳ ඇතිරිලි සහ කොට්ට ලබාදීමේ වැඩසටහනක් ඉකුත් පෙබරවාරි 08 දින මඩකලපුවේ කොක්කඩිචෝලායි මුතාලි කුඩා පාසලේදී පවත්වන ලදී. එම කටයුත්ත සඳහා භාණ්ඩ සැපයීමට කොමර්ෂල් බැංකුවේ අනුග්‍රාහකත්වය ලබාදී තිබුණි.

## 13 වසරක ගමන්මඟ සමරමින්....

යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ 13 වන සංවත්සරය සමරමින් යාන්ත්‍රික පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒජීඩීඑන් ජයසුන්දර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් පරිදි මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එස්ජේ ප්‍රියදර්ශන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ විශේෂිත වූ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. එහිදී රෙජිමේන්තුවේ සේවය කොට ප්‍රාණ දානය කැපකළ රණවිරුවන් හට පිං පැමිණවීම හා රෙජිමේන්තුවට ආශිර්වාද කිරීමේ අරමුණින් සර්ව රාත්‍රික පිරිත් දේශනාවක් පැවැත්වීම, උදෑසන සංඝරත්නය උදෙසා හීල් දානය පූජා කිරීම විශේෂ කටයුත්තක් විය. මේ සඳහා රෙජිමේන්තුවට අයත් ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ නිලධාරීන්, සෙසුනිලයින් ඇතුලු විශාල පිරිසක් සහභාගි වූහ.





## ඒකක සංවත්සරය සමරමින්....





3 වන බළඇණිය වෛද්‍ය බළකාය සිය 21 වන සංවත්සරය 2020 මාර්තු 01 දින උත්සවාකාරයෙන් සමරන ලදී. ඒකක අණදෙන නිලධාරී මේජර් ආර්එම්ඩීබී රාජපක්ෂ වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, රුක් රෝපණය, භට පිරිස් ඇමතීම සහ සියලු නිල දිවා භෝජන සංග්‍රහය වැඩසටහන් අතරට එකතුව තිබිණ. තවද ඒකකය තුළ අභිනවයෙන් ඉදිකරන ලද ස්ටාලයිට් රෙස්ට් නිවාඩු නිකේතනය විවෘත කිරීම සංවත්සර දින සුවශේෂී අංගයක් විය. ශ්‍රී ලංකා වෛද්‍ය බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් එස්එච් මුණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී විසින් එම නිවාඩු නිකේතනය විවෘත කළ අතර, සියලු නිලයින්ගේ රසාස්වාදය සඳහා එදින සංගීත සැඳෑවක්ද පවත්වන ලදී. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී සහභාගි වූ අතර ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද) ආඥාපති මේජර් ජෙනරාල් එල්පීආර් ප්‍රේමලාල් යූඑස්පීද ඊට එක්විය.

## දිළිඳු පවුල් වෙත දිරියක් වෙමින්...





64 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ අදහසකට අනුව මුතියන්කඩ්ඩුකුලම් ග්‍රාමසේවා වසමේ තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් 09 ක් වෙත, ඔවුන්ගේ ඉදිවෙමින් පවතින නිවාස සඳහා උළුවහු හා ජනෙල් සකස් කර ගැනීමට අවශ්‍ය ලී දඬු බෙදාදීමේ උත්සවයක් 2020 පෙබරවාරි 16 සිදු කරන ලදී.

## දරුවන්ගේ අධ්‍යාපනයට මුල්වෙමින්...

65 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සහභාගීත්වයෙන් 651 බළසේනාව යටතේ පාලනය වන 19 ශ්‍රී ලංකා පාබල හමුදාවේ භට පිරිස් විසින් සංවිධානය කළ පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් නාච්චිකුඩා රජයේ මුස්ලිම් මිශ්‍ර පාසලේදී 2020 පෙබරවාරි 28 දින පවත්වන ලදී.



# දිරිය දරුවන්ට අත්වැලක්...





පුනරින් මධුවිනාඩු රජයේ දෙමළ මිශ්‍ර පාසලේ අධ්‍යාපනය ලබන සිසුන් 18 දෙනෙකු හට පාසල් උපකරණ බෙදාදීම ඉකුත් පෙබරවාරි 24 දින 24 විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් සිදුකරන ලදී. 66 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ඩී විජේසුන්දර ආර්එස්පී ගේ ඉල්ලීම පරිදි පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ 83 කණ්ඩායම වෙනුවෙන් රත්නසේන කුඩලිගම මහතා විසින් එම පාසල් උපකරණ සඳහා අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී

---

## තුරුලිය රැකුමට උරදෙමින්...





515 බළසේනා මූලස්ථානයේ සංවිධාන ශක්තියෙන් තෙලිප්පලේ සහ කෝපායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් දේවස්ථාන සහ කෝවිල් වෙත පැළ බෙදාදීමේ උත්සවයක් 51 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීඑල් රත්නායක ගේ ප්‍රධානත්වයෙන් 2020 මාර්තු 09 දින මාවඩිපුරම් කෝවිල් ශාලාවේදී පැවැත්විණ. යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ සංකල්පයකට අනුව යාපනය බළ ප්‍රදේශය හරිත කලාපයක් බවට පත්කිරීම මෙම වැඩසටහනෙහි අරමුණයි.

## දස වසක අභිමන්...

11 සේනාංකයේ 10 වන සංවත්සරය 2020 පෙබරවාරි 15 දින සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ඒඑස් බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. සේනාංක ධජයට සෙත්පතා ශ්‍රී දළදා වහන්සේ වෙත ගිලන්පස පූජාවක් සහ කිරි ආහාර පූජාවක් පැවැත්වීම, සේනාංකාධිපති වෙත සම්මාන මුරයක් සහ සම්මාන ආචාර පෙළපාලියක් පිරිනැමීම, හට පිරිස් ඇමතීම සහ සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම සංවත්සර වැඩසටහන් අතර කැපී පෙනුණ අංග විය.





# සිවිල් ජනයාගේ ආරක්ෂාවට කැපවෙමින්...





කිලිනොච්චි ජනතාවගේ ජීවන තත්වය නංවාලීම, ආරක්ෂාව සහ සාමය ස්ථාපිත කිරීමේ අරමුණින් 57 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීපීඑස් ද සිල්වා ආර්එස්පී ගේ සහභාගීත්වයෙන් 2020 පෙබරවාරි 18 දින සාකච්ඡාවක් පවත්වන ලදී. මේ සඳහා ප්‍රදේශයේ සියලුම පොලිස් ස්ථාන භාර නිලධාරීන්, විශේෂ කාර්ය බළකායේ නිලධාරීන්, ආගමික නායකයින්, විදුහල්පතිවරු සහ ප්‍රදේශයේ සිවිල් වැසියන් ඇතුලු රජයේ නිලධාරීන් රැසක් සහභාගි වූහ.





# විරු දැතින් පිළිසරණක්...

21 සේනාංකයට අයත් 212 බලසේනා බලප්‍රදේශයේ පිහිටි 5 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භට පිරිස් විසින් තන්තිරිමලේ කටුකැළියාව ප්‍රදේශයේ පදිංචි අසරණ පවුලක් වෙනුවෙන් ඉදිකරනු ලැබූ නව නිවස ඉකුත් මාර්තු 14 දින යුද්ධයෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවෙකුගේ භාර්යාව ඇතුලු දරුවන් වෙත පවරාදෙනු ලැබීය.

21 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් අනුරාධපුර රෝහලේ වෛද්‍ය මධුෂිකා කොස්තා මහත්මිය වෙනින් කරනු ලැබූ ඉල්ලීමකට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා අනුග්‍රහය දක්වන ලදී. මෙම අවස්ථාවේදී නිවාස ප්‍රතිලාභියා වන වයි ඩබ්ලිව් මනෝරා කුමාරි මහත්මිය වෙත අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ සහ විදුලි උපකරණ ද පරිත්‍යාග කරන ලදී.



# රුක් රෝපණයට මුල්වෙයි...

65 සේනාංකයෙහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් මත 651 බලසේනාධිපති කර්නල් ඩබ්ලිව්ජ්සීඑන් වරකාගොඩ පීඑස්සී ගේ අධීක්ෂණයෙන් 19 ශ්‍රී ලංකා පාබල හමුදාව මගින් සංවිධානය කරන ලද රුක් රෝපණ වැඩසටහනක් ඉරනමාතානගර් සෙබමාලේ මාතා කතෝලික දේවස්ථානයේදී 2020 මාර්තු 23 දින පවත්වන ලදී. මේ සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් මෙන්ම සිවිල් වැසියන් 40 දෙනෙක්ද සහභාගි වූහ.

## ලේ බිඳක් දන්දෙමින්...





රට තුළ උද්ගතව ඇති කොරෝනා වෛරසය පැතිරයාමේ අවදානම් තත්වය හේතුවෙන් මාතලේ මහ රෝහල වෙත අවශ්‍ය රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2020 මාර්තු 23 දින පවත්වන ලදී. මේ සඳහා 1 වන විශේෂ බළකා කඳවුරේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් 124 ක් සහභාගී වූහ.

## රණවිරු දෑතින් නිසට සෙවණක්...





ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපතිගේ උපදෙස් පරිදි එම බළ ප්‍රදේශයේ තෝරාගන්නා ලද අඩු ආදායම්ලාභී දිළිඳු පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියේ තවත් එක් පියවරක් ලෙස 21 සේනාංකයට අයත් ඇත්දත්කල්ල, පේමඩුව යන ලිපිනයේ පදිංචි කේඩී නන්දසේන මහතාගේ පවුල වෙත නව නිවසක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම 2020 පෙබරවාරි 06 දින 212 බළසේනාධිපති කර්නල් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී. ඕස්ට්‍රේලියාවේ පදිංචි ශ්‍රී ලාංකික දානපතියෙකු වන ජගත් ගුණසේකර මහතාගේ ධන පරිත්‍යාගයෙන් සිදුකෙරෙන මෙම මාහැඟි කටයුත්ත සඳහා 5 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව විසින් ශ්‍රම දායකත්වය ලබාදෙන ලදී.

## 29 වන සංවත්සරය සමරා...

වාකරේ ප්‍රදේශයේ ස්ථාපිත 233 බළසේනා මූලස්ථානයේ 29 වන සංවත්සරය ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් ඉකුත් පෙබරවාරි 25 දින උත්කර්ෂවත්ව සමරන ලදී.

එහිදී එම බළසේනාවේ සේවයේ නියුතු සාමාජිකයින් 75 දෙනෙකු පොළොන්නරුව ලේ බැංකුව සමග එක්ව රුධිරය පරිත්‍යාග කිරීම විශේෂ විය. සංවත්සර දිනයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 23 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒජීඩීඑන් ජයසුන්දර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගි වූ අතර, 233 බළසේනාවේ බළසේනාධිපති කර්නල් ආර් ඇල්විටිගල යූඑස්පී, ඇතුළු අනෙකුත් ජ්‍යෙෂ්ඨ කනිෂ්ඨ නිලධාරීන්, සෙසුනිලයින් විශාල පිරිසක් ද ඊට සහභාගි වූහ. 2020 පෙබරවාරි 28 දින බළසේනා මූලස්ථායේ බෞද්ධ මන්දිරය තුළ බුද්ධ ප්‍රතිමා වහන්සේලා 28 නමක් තැන්පත් කිරීම, සර්වරාත්‍රික පිරිත් දේශනාවක් පැවැත්වීමද සංවත්සර දින වැඩසටහන් අතර කැපී පෙනුණු අංග විය.





VISION

# English

VISION SPECTRUM

English Vision පාඩම් මාලාව ඔස්සේ Art of the Language (භාෂාවේ කලාව) අධ්‍යයන සඳහා 'රණවිරුවා' මාසික සගරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Look/Looks + Like

මෙම වාක්‍යය රටාව බොහෝ විට භාවිතා වනුයේ "වගේ පේනවා" යන අර්ථය සහිතව යම්කිසි වස්තුවක්, යමෙක් හෝ යමෙක් පිළිබඳව විස්තර කිරීමේදීය, දී ඇති නිදසුන් ඇසුරෙන් වාක්‍යය රටාවෙහි භාවිතය අධ්‍යනය කරමු.

**Formula - සූත්‍රය**

Subject + Look/Looks + Like +
Adjective / Adjective phrase

සබ්ජෙක්ට් + ලුක්/ලුක්ස් + ලයික් + ඇජෙක්ටිව්/ඇජෙක්ටිව් ප්‍රේස්

කර්තෘ + වගේ පේනවා +
නාම විශේෂණය/නාම විශේෂණ ඛණ්ඩය

Ex/උදා:-

1. You look like tired.
   යූ ලුක් ලයික් ටයර්ඩ්.
   ඔයාට මහන්සි වගේ පේනවා.
2. He looks like too much.
   හී ලුක්ස් ලයික් ටූ මච්.
   ඔහු ඕනවට වැඩී වගේ පේනවා.
3. Nimali looks like shy.
   නිමාලි ලුක්ස් ලයික් ෂයි.
   නිමාලි ලැජ්ජාවෙන් වගේ පේනවා.
4. It looks like a venomonous serpent.
   ඉට් ලුක්ස් ලයික් අ වෙනමනස් සර්පෙන්ට්.
   ඌ විසකුරු සර්පයෙක් වගේ පේනවා.

Noye Bene/සැ:යු :-

- Subject

වාක්‍යයේ යෙදෙන කර්තෘ පදය අනුව එනම්, ***Subject plural*** (කතෘ බහුවචන) පද සමග ***Look*** යන පදය සහ ***Subject Singular*** (ඒක වචන) පද සමග ***Looks*** යන පදය භාවිතා වේ.

***Look - I, We, You, They -*** ඇතුලු බහුවචන කර්තෘ පද සමග භාවිතා වේ.

***Looks - He, She, It -*** ඇතුලු ඒකවචන කර්තෘ පද සමග භාවිතා වේ.

***Like -*** යන පදය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.

- Look/Looks + Like - "වගේ පේනවා" යන අර්ථ සහිත ඉහත පෙන්වා දී ඇති පරිදි භාවිතා වේ.

- Adjective

නාම විශේෂණ එනම්, නාම පදයක් විස්තර කිරීම සඳහා භාවිතයට ගන්නා පද මෙහිදී භාවිතා වේ. උදා -Shy - ලැජ්ජයි, Tird - මහන්සියි, Beautiful - ලස්සනයි, Fool - මෝඩයි,

**Analysis of the sentence formation - වාක්‍ය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය**

Subject + Look/Looks + Like + Adjective / Adjective phrase

සබ්ජෙක්ට් + ලුක්/ලුක්ස් + ලයික් + ඇජෙක්ටිව්/ඇජෙක්ටිව් ප්‍රේස්

කර්තෘ + වගේ පේනවා +
නාම විශේෂණය/නාම විශේෂණ ඛණ්ඩය

you look like lazy
යූ ලුක් ලයික් ලේසි
ඔයා කැම්මැලි වගේ පේනව.

English Vision නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා 'රණවිරුවා' මීළඟ කලාපය සමග එක්වන්න. තවද ඔබට මගහැරුණු පාඩම් අධ්‍යයන කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

English Vision
Join The Best To Be The Very Best…
Aviation of new culture in studding English & the art of language, we designed.
English Instructor – Captain Chaminda Liyanage SLAGSC
Info – Tp 0719200733 Web : www.englishvision.lk Email : milangaliyanage@gmail.com
Fb Page : English Vision Art of The Language

කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලයුපොදුසේබ
සංඥා පුහුණු පාසල - බූවැලිකඩ
www.englishvision.lk





# රෙජිමේන්තු ඉතිහාසය



## ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය

"සව්බල සිත් අව්බල දෙත්" යන වදන් පෙළ රෙජිමේන්තු ආදර්ශ පාඨය කර ගනිමින් 1979 දී එවකට යුද්ධ හමුදාධිපති වී සිටි ජෙනරාල් දේශමාන්‍ය ජේඑඩී පෙරේරා වීඑස්වී එන්ඩීසී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ පළමුවන යුද්ධ හමුදා කාන්තා බළකාය පිහිටුවන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉතිහාසයේ නව පරිච්ඡේදයක් අරඹමින් පිහිටුවන ලද පළමුවන කාන්තා බළකායේ මූලික අරමුණ වූයේ කාර්යාලයන්හි රාජකාරිවල නිරත තම සහෝදර සෙබලුන් ක්ෂේත්‍ර රාජකාරි සඳහා මුදවා හැරීමය. එම බළකායේ පුහුණුවීම් සිදුකිරීම සඳහා බ්‍රිතාන්‍යය රාජකීය යුද්ධ හමුදාවේ මඟපෙන්වීම යටතේ නිළධාරිණියන් තිදෙනෙකුගෙන් සමන්විත ප්‍රථම කාන්තා කෙඩෙට් නිළධාරිණීන් කණ්ඩායම බ්‍රිතාන්‍යයේදී පුහුණුව ලැබීමත් සමඟ කාන්තා බළකාය ආරම්භ විය.

මිලේච්ඡ ත්‍රස්තවාදය රට පුරා ව්‍යාප්ත වීමත් සමග ඇති වූ ජාතික අවශ්‍යතාවයට උර දෙමින් මාතෘ භූමියේ ස්වෛරීභාවය රකිනු වස් සෙබලුන් හා උරෙන් උර ගැටී ක්ෂේත්‍ර රාජකාරි ඉටු කිරීමේ අභිලාෂයෙන් දෙවන ස්වේච්ඡා කාන්තා බළකායත් ඉන් අනතුරුව තුන්වන හතරවන පස්වන හා හයවන ස්වේච්ඡා ඒකක හා හත්වන නිත්‍ය කාන්තා ඒකකය ස්ථාපනය විය. මෙම ඒකක ස්ථාපිත වීමත් සමග ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායේ මෙහෙවර තවත් පුළුල් විය. එහි ව්‍යාප්තියත් සමගින් කාන්තා ඒකකයන්හි පාලන කටයුතු මෙන්ම අණදීම විධිමත්ව පවත්වා ගැනීම සඳහා 1997 දී ශ්‍රී ලංකා



කර්නල් සේනාවිධායක
මේජර් ජෙනරාල් සීඑම්ඩීපී චන්ද්‍රසේකර එන්ඩියු

"කුරිරු ත්‍රස්තවාදය හේතුවෙන් බළකායේ නිළධාරිණීන් හා සෙබළියන් සැලකිය යුතු ප්‍රමාණයක් තුවාල ලැබූ අතර වීරෝදාර සෙබළියන් 25 දෙනෙකු දේශයේ නාමයෙන් තම අවසන් සුසුම් වාතලයට මුසු කළෝය. තම මවට දියණියක් වූ ඇය ඒ සියළු යුතුකම් පසෙකලා අවසන් මානුෂීය මෙහෙයුමේ දී ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදා ගත් අහිංසක සිවිල් වැසියන් හට විටෙක මවක්ද විටෙක සොයුරියක්ද තවත් විටෙක හෙදියක්ද වෙමින් සිදුකළ ප්‍රශංසනීය මෙහෙවර ලක්වාසීන්ගේ පැසසුමට ලක් වීය."

යුද්ධ හමුදා කාන්තා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථානය කොළඹදී ආරම්භ කරන ලදී. වත්මනෙහි ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය නිත්‍ය ඒකක දෙකකින් හා ස්වේච්ඡා ඒකක හතරකින් සමන්විත වී දිවයිනේ පළාත් රැසක් ආවරණය කරමින් රාජකාරීන්හි නිරත වී සිටී.

කුරිරු ත්‍රස්තවාදය හේතුවෙන් බළකායේ නිළධාරිණීන් හා සෙබළියන් සැලකිය යුතු ප්‍රමාණයක් තුවාල ලැබූ අතර වීරෝදාර සෙබළියන් 25 දෙනෙකු දේශයේ නාමයෙන් තම අවසන් සුසුම් වාතලයට මුසු කළෝය. තම මවට දියණියක් වූ ඇය ඒ සියළු යුතුකම් පසෙකලා අවසන් මානුෂීය මෙහෙයුමේ දී ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදා ගත් අහිංසක සිවිල් වැසියන් හට විටෙක මවක්ද විටෙක සොයුරියක්ද තවත් විටෙක හෙදියක්ද වෙමින් සිදුකළ ප්‍රශංසනීය මෙහෙවර ලක්වාසීන්ගේ පැසසුමට ලක් වීය. තම වෘත්තීය නිපුණත්වයන් වැඩි දියුණු කර ගන්නා අතරම ක්‍රීඩා කුසලතා ජාත්‍යන්තරයට ගෙන යමින් රන් පදක්කම් ලබමින් තම මව්බිමට කීර්තියක් හා ගෞරවයක් ලබා දුන් නිළධාරිණියන් හා සෙබළියන් කාන්තා බළකාය සතු වත්කම් වේ.

වත්මනෙහි ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායේ කර්නල් සේනාවිධායක ලෙස මේජර් ජෙනරල් සීඑම්ඩීපී චන්ද්‍රසේකර එන්ඩියූ යන ජ්‍යෙෂ්ඨ නිළධාරී රාජකාරි කටයුතු කරනු ලබයි.

ඉදිරිපත් කිරීම
රෙජිමේන්තු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

2020 මාර්තු මස 06 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල් ජීඩබ්ලිව්ඩීකේ ජයතිලක යූඑස්පී එන්ඩියූ**

2020 මාර්තු මස 05 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



61 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල් කේඑච්පීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ**

2020 මාර්තු මස 04 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



141 බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර් එල්පීකේසී විජේතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

2020 මාර්තු මස 04 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



223 බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල් ඩබ්ලිව්ඒඑන්එස් පෙරේරා යූඑස්පී**

2020 මාර්තු මස 02 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



පාබල හමුදා අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්නල් පාබල හමුදා ලෙස

**කර්නල් කේඑච්එන්පී හැන්නැදිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**

2020 මාර්තු මස 06 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) කර්නල් ප්‍රමා ලෙස

**කර්නල් එච්වීඒ සෝමවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

2020 මාර්තු මස 05 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



642 බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල් ඩබ්ලිව්එම්පීඑම් විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2020 මාර්තු මස 02 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථාන (කිලිනොච්චිය) ප්‍රමානි 1 (ක්‍රියා) ලෙස

**ලුතිනන් කර්නල් ටීඑල්එම් චන්ද්‍රසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**

2020 මාර්තු මස 07 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



20 වන බලඇණිය ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස

**මේජර් ඩබ්ලිව්එම්ඩබ්ලිව්ඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2020 මාර්තු මස 12 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



2 වන බලඇණිය ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස

**මේජර් කේජේඑන්එම්යූකේ නවරත්න**

2020 මාර්තු මස 02 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



7 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස

**මේජර් බීඩබ්ලිව්එස්එස්ටී පීරිස්**

2020 මාර්තු මස 07 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු

# රන දිවියට විරු සත්කාරයක්...





කොරෝනා වෛරසය හේතුවෙන් දිවයින පුරා ඇඳිරිනීතිය පැනවීම නිසා දැඩි දුෂ්කරතාවයකට පත්ව සිටින කච්චුවරි, පුදියකොලානි, පන්නික්කකුලම් සහ ඔළුමඩු ප්‍රදේශයන්හි අඩු ආදායම්ලාභී පවුල් සඳහා පිසින ලද ආහාර සහ පානීය ජලය බෙදාදීමේ වැඩසටහනක් 571 බළසේනාවේ භටපිරිස් විසින් 2020 මාර්තු මස 26 සිදු කරන ලදී.

ඊට සමගාමීව නව කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා සිවිල් වැසියන් දැනුවත් කිරීමේ වැඩසටහනක්ද, 571 සහ 572 වන බළසේනා මූලස්ථානය මගින් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන් කිළිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථාන ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහ 57 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීපීඑස් ද සිල්වා ආර්එස්පී ගේ උපදෙස් මත පැවැත්විණ.

---



# සුබ උපන්දිනයක්...






අටවන වියට පා තබන

**නෙත්මික සනිජ බංඩාර පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම
(සෙ/240349 බනි 1 ඒඒජී උපතිස්ස බංඩාර)



අටවන වියට පා තබන

**සෙනාලි ගිහංසා දිසානායක දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම
(සෙ/11ඕ00787 බනි 1 ඩීඑම්ජේඑස් අධිකාරි)



පස්වන වියට පා තබන

**සනුජ නෙතුල් ප්‍රියදර්ශන පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම
(සෙ/752663 සැරයන් ප්‍රියදර්ශන පීකේඩී)





හතරවන වියට පා තබන

**සයුර නෙත්සර ජයරත්න පුතුට**

සහ

අටවන වියට පා තබන

**දිනෙත් නිම්සර ජයරත්න පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම
(සෙ/14ඩී01345 ලා/කෝ ජයරත්න ඩබ්ලිව්ජීඑස්කේ)

# රණක්ෂිතයට පත් විරුවන් දඹදිව වැඳපුදා ගනී...





යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයකට අනුව යුද්ධයේදී බරපතල තුවාල ලබා රණක්ෂිතයට පත් රණවිරුවන්ට දඹදිව ඓතිහාසික සිද්ධස්ථාන වැඳපුදා ගැනීමට අවස්ථාවක් පසුගියදා උදාකරදෙන ලදී. යුද්ධ හමුදා පුනරුත්ථාපන අරමුදල මගින් වැයදැරූ මෙම කටයුත්ත බ්‍රිගේඩියර් අයිඑච්එම්ටීඑච් සේනාරත්න යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පුනරුත්ථාපනලාභීන් 15 දෙනෙකු හා එහි කාර්ය මණ්ඩලයේ 05 දෙනෙකු හට මෙම වරම හිමි විය.

එම සංචාරය තුළ ඔවුන් විසින් දිල්ලිය, සැවැත්නුවර, කපිලවස්තුපුර, ලුම්බිණිය, කුසිනාරාව, විශාලා මහනුවර, රජගහනුවර, බුද්ධගයාව, බරණැස් නුවර සහ අග්‍රා යන නගර ආශ්‍රිත සිද්ධස්ථාන වල සංචාරය කරන ලද අතර, බුද්ධගයාවේ සිල් සමාදන් වී ආගමික වාතවත්වල ද නිරතවන ලදී.

---


## රණවිරුවා

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**
සෙ/752158 සැරයන් සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 ලාන්ස් කෝප්‍රල් කුමාරසිංහ එම්ජීජ්එම් - 11 ඉසේරෙ
සෙ/2081045 ඉසෙ ලක්තිලිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**
රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.

**ඊමේල්**
dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**
011 2993076

**යුහ දිගුව**
51445/51446

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය








**අධීක්ෂණය**
බ්‍රිගේඩියර් එම්පී කරුණාරත්න අයිපී



**උපදේශකත්වය**
ලුතිනන් කර්නල් එස්ජේ කාරියකරවන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී - විපාරෙ



**ප්‍රධාන සංස්කාරක**
මේජර් සුපිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ



**සහාය සංස්කාරක**
කපිතාන් ආර්ඩී හේවාවිතාරණ - ශ්‍රීලයුකාබ



**සෝදුපත් කියවීම**
කපිතාන් ඩීඑම් දිල්හාරා සජීවනී - ජාශිබ

# "වීර්ය මාතා" මව්වරුන් අගයමින්...




වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සංකල්පයක් මත යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවේ පූර්ණ සහයෝගය ඇතිව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය, රණසේවා අධ්‍යක්ෂ මණ්ඩලය සහ පිරිස් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ එකතුවෙන් සංවිධානය කළ "වීර්ය මාතා" (ධෛර්යමත් මව්වරුන්) සඳහා උපහාර පිදීමේ උත්සවයක් යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේ දී පසුගිය මාර්තු 10 දින පැවැත්විණ. යුද්ධයෙන් මියගිය වීරෝදාර රණවිරුවන්ගේ භාර්යාවන් 110 දෙනෙකුගේ කැපකිරීම අගයකරමින් ඔවුන් වෙත කෘතඥතාවය පුදකිරීමේ උදාර අරමුණ පෙරදැරිව මෙම විශේෂ "වීර්ය මාතා" සම්මාන ප්‍රදානය සිදු කරනු ලැබීය.



පසුගියදා යෙදුණු ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව පැවති මෙම උපහාර උළෙලෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජනාධිපති ආර්යා අයෝමා රාජපක්ෂ මහත්මිය සහභාගි වූ අතර, යුද්ධ හමුදාධිපති සහ මෙම නව ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා කැපවූ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මිය එම අවස්ථාවේදී එතුමියව මහත් හරසරින් පිළිගන්නා ලදී.

වීර්ය මාතාවන් වන ඒ ධෛර්යය සම්පන්න මව්වරුන් තම දූවා දරුවන් වෙනුවෙන් කැපවෙමින් ඔවුන්ට සරසවි වරම් ලබාදීමෙන් පසු සමාජයේ පිළිගත් පුද්ගලයින් බවට පත් කිරීමෙහිලා ඉටුකළ අනුපමේය වූ මෙහෙය අගයා එම උදාර මාතෘත්වය වෙනුවෙන් එම මව්වරුන් සහ දූවා දරුවන් වෙත මෙම විශේෂ සම්මාන, සහතික සහ මූල්‍යමය ත්‍යාග ප්‍රදානය කරනු ලැබීය.








# ආශිර්වාදයට වඩා සහයෝගය අවැසි මොහොතක්...



මේ වසංගතය අපේ රටේ ඔලුව උස්සන්න හදපු මුල් අවස්ථාවේ ඉඳන් ඊට මුහුණ දීමේ අභියෝගයේ වැඩි බරක් පැටවුණේ යුද්ධ හමුදාවට. ඒ නිසාමයි කොවිඩ් - 19 වෛරසය පැතිරීම වැළැක්වීමේ මධ්‍යස්ථාන ප්‍රධානි ලෙස යුද්ධ හමුදාධිපතිතුමන් පත් කරන්නෙ. අනතුරුව එතුමන්ගේ මූලිකත්වයෙන් රට පුරා කොරෝනා ව්‍යාප්තියට වැට බැඳීමේ දැවැන්ත ක්‍රියාන්විතයක් ඇරඹෙනවා. එදා ඉඳන් අද වෙනකල් එක සීරුවට රණවිරුවො ඒ වෙනුවෙන් වැඩ. ඒ කටයුත්තෙදී සමාජයට නිරාවරණය වුණ ප්‍රමාණයට වඩා තිරය පිටුපස වූ ඔවුන්ගේ අප්‍රකට මෙහෙවර අති මහත්. නිදි වරා නොපියවූ දෑස් වගේම ඔවුන්ගේ දෝර ගලන දහඩිය සුසුම් ඊට සාක්ෂි දරනවා. අවි බලයෙන් හෝ වෙනත් සංග්‍රාමික හැකියාවන්ගෙන් මේ සටන ජය ගන්න බැරි වුණත් හමුදාවක තියෙන සාමූහික ශක්තිය, විනය හා කැපවීම තුළින් අපි මේ ව්‍යසනය තුරන් කරන්න උපරිමයෙන් කැපවෙනවා. නමුත් අමතක කරන්න එපා, ඒකට ඔබේ සහයෝගය අවශ්‍යමයි.



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.